# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. LCGD/AD/7/7/1 (2020)    ඔබේ අංකය / உமது இல / Your No    දිනය / திகதி / Date 2020.02.26

චක්‍රලේඛ අංක 2020/4

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

## රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබාදීමේදී එකවර දීමනාපත්‍ර ලබා දීම

රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේදී එකවර දීමනාපත්‍රයක් නිකුත් කිරීමට අදාළව නිකුත් කර ඇති අංක 2015/09 සහ 2015/09 (I) චක්‍රලේඛ අවලංගු කර පරිශීලනයේ පහසුව සඳහා අදාළ පැහැදිලි කිරීම් සහිතව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. නේවාසික කටයුතු සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබාදුන් ඉඩම් නිසි පරිදි සංවර්ධනය කර භුක්තිවිඳී නම් තක්සේරු මුදල අයකර ගැනීමෙන් පසුව නිදහස් දීමනාපත්‍ර ලබා දීම වර්තමාන ප්‍රතිපත්තිය වේ. මෙතෙක් මේ සම්බන්ධයෙන් පැවති ක්‍රමවේදය වන්නේ ඉල්ලුම්කරු වෙත පළමුව දීර්ඝකාලීන බදුකරයක් නිකුත්කර අනතුරුව දීමනාපත්‍ර ලබාදීමයි. එහෙත් මෙම ක්‍රමවේදය භාවිතා කරමින් නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී දීර්ඝකාලයක් ගතවීම හේතුවෙන් සේවාලාභීන් දුෂ්කරතාවයට පත්වනවා මෙන්ම එක් කාර්යයක් සඳහා සංකීර්ණ ක්‍රියා පටිපාටි දෙකක් අනුගමනය කිරීම පරිපාලනමය වශයෙන් ද බාධාකාරී තත්ත්වයක් බවට හඳුනාගෙන ඇත.

03. ඉඩම් ලබා දීමේ දී ඇතිවන දුෂ්කරතාවයන් අවම කර ගැනීමේ අරමුණින් ඉදිරියේ දී රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4-1/28(IV) වෙළුම හා 2015.12.10 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇත.

04. ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන අනුව පහත දැක්වෙන කණ්ඩායම්වලට අදාළව නේවාසික කටයුතු සඳහා ඉඩමක් ලබා ගැනීමට සුදුසුකම් ලැබූ පුද්ගලයකුට අදාළ ඉඩම සංවර්ධනය කර ස්ථිර ලෙස පදිංචිව සිටින්නේ නම් හා එම ඉඩමේ සම්පූර්ණ තක්සේරු වටිනාකම හා වාර මුදල ගෙවීමෙන් පසුව එකවර දීමනාපත්‍ර ලබාගත හැකිය.

I. මෙතෙක් දීර්ඝකාලීන බදු අනුමැතියක් ලබා දී නොමැති නමුත් තෝරා ගැනීමේ දින සිට වසර 10ක කාලයක් ගත වී ඇති පුද්ගලයන්ට.

II. දීර්ඝකාලීන බදු අනුමැතියක් ලබා දී ඇති හා බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 10 ක් ගත වූ පුද්ගලයන්ට.

III. දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කර ඇති, බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05 ක් ගත වී ඇති පුද්ගලයන්ට.

05. මෙසේ එකවර දීමනාපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට දීමනාපත්‍ර නිකුත් කරනුයේ ඉඩමේ තක්සේරු මුදල සහ වාර මුදල/ දඩ මුදල ගෙවා අවසන් කළ පසුවය. තවද දැනට ඉහත පරිදි දීමනාපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් තිබුණේ වුවද එසේ ලබා ගැනීමට අපේක්ෂා නොකරන පුද්ගලයන්ට දීර්ඝකාලීන බදුකරයක් ලබාගත හැකි අතර ඔවුන් අපේක්ෂා කරන මතු දිනයක දී ඉහත පරිදි දීමනාපත්‍රයක් ඉල්ලුම් කළ හැකිය.

06. ඉහත II හා III කාණ්ඩයන්ට අදාළව මේ වන විට බදු අනුමැතිය ලබා ඇති හා දීර්ඝකාලීන බදුකර නිකුත් කර ඇති රජයේ ඉඩම් බදු ගැනුම්කරුවන් විසින් නිසි පරිදි සංවර්ධනය කර භුක්ති විඳින්නේ නම්, බදු පදනම් වර්ෂයේ නොදියුණු තක්සේරුව සම්පූර්ණයෙන් හා වාර මුදල/ දඩ මුදල අයකර ගැනීමට කටයුතු කරන්න. දෙවන බදු කාලයක් අනුමත කර තිබේ නම්, දෙවන බදු කාලයට අදාළව දීමනාපත්‍රය ඉල්ලුම් කළ දින දක්වා බදු මුදල් අයවිය යුතු වේ.

07. මෙම අවස්ථාවන් දෙකට අදාළව පළමුව 'O' රේඛා චිත්‍ර ඉල්ලුම් කිරීමට පෙර දීමනාපත්‍ර අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර නිසි පරිදි සංවර්ධනය කර තිබේනම් දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී වෙත 'O' රේඛා චිත්‍ර මැනුම් ඉල්ලීමක් යොමු කරන්න. එකී පූර්ව අවශ්‍යතාවයන් සම්පූර්ණ වීමෙන් පසු එකවර දීමනාපත්‍ර ලබාදීම සඳහා පහත ලියවිලි ද සහිතව ඔබගේ නිර්දේශ පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් හරහා මා වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

1. නිදහස් දීමනාපත්‍ර සඳහා සලකා බැලීමේ වාර්තාව
2. නොදියුණු වටිනාකම හා වාර මුදල/ දඩ මුදල සම්පූර්ණයෙන්ම අයකරන ලද බවට සනාථ කරන රිසිට්පත්වල/ බදු අයකළ බදු ලෙජරයේ සහතික කරන ලද පිටපත්, දෙවන බදු කාලයක් තිබේ නම් මේ දක්වා බදු මුදල් අයකළ බවට සනාථ කරන රිසිට්පත්වල/ බදු ලෙජරයේ සහතික කරන ලද පිටපත්
3. තක්සේරු වාර්තාවේ සහතික කරන ලද පිටපත
4. දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කර ඇත්නම් දීර්ඝකාලීන බදුකරය අවලංගු කිරීමේ එකඟතා ගිවිසුම හා බදුකරයේ මුල් පිටපත
5. බදුකරයක් නිකුත් කර ඇත්නම් පත්ඉරු වාර්තා
6. 'O' රේඛා චිත්‍ර මැනුම් ඉල්ලීමේ පිටපත්

08. දැනටමත් බදු අනුමැතීන්ට අදාළව දීර්ඝකාලීන බදුකර පිළියෙල කිරීම සඳහා මා වෙත 'L' රේඛා චිත්‍ර යොමුකර ඇත්නම්, මාගේ 2017/3 චක්‍රලේඛ ප්‍රකාරව මවිසින් එම 'L' රේඛා චිත්‍ර 'O' රේඛා චිත්‍ර බවට දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි වෙතින් පරිවර්තනය කර ගැනීමට කටයුතු කරනු ඇත.

09. මේ අනුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබාදීමේ දී ඉහත සඳහන් කරුණුවලට අදාළ වන පුද්ගලයින් වෙත පළමුව දීමනාපත්‍ර අනුමැතිය ලබා ගැනීමේ වැඩ පියවර මෙම සංශෝධිත කරුණු මඟින් ඉවත් කරන අතර එකවර දීමනාපත්‍ර ලබාදීම සඳහා මේ පිළිබඳ දැනුවත් කර සුදුසුකම් ලබන පුද්ගලයින්ගේ ඉල්ලීම් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ඔබ විසින් පියවරගත යුතුයි.

මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් මා විමසන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
4. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය